කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) - 2022
-----------------------------------------------------------------

කළුගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 1 හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2017 ජූලි 07 දින එලඹි අංක එස්.එල්-පී 117 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 19 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කළුගඟ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම සහ ජල බෙදා හැරීමේ ජාල ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් බස්නාහිර පළාතේ දකුණු ප්‍රදේශයේ ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, එමඟින් එහි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 05 ක් යටතේ ක්‍රියාත්මක වන අතර එනම් ජල තුළුමුව පහසුකම සහ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, සම්ප්‍රේෂණ ප්‍රධාන ජාලයන් හා බෙදාහැරීමේ ජාලයන් සැපයීම සහ ඇතිරීම්, භූගත ජලාශ සහ පොම්පාගාර ඉදිකිරීම, මිල්ලනිය සඳහා ද්විතියික බෙදාහැරීම් ජාලය සැපයීම සහ ඇතිරීම, බෙදාහැරීමේ ප්‍රධාන ජාලයන්හි සහ ද්විතියික ජාලයන්හි ඉතිරි කොටස සැපයීම සහ ඇතිරීම ඇතුළු දිස්ත්‍රික් මිණුම් කලාප (DMA) උපකරණ සැපයීම සහ සවි කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 55,349 කට සමාන ජපාන යෙන් මිලියන 39,067 ක් සහ ඉන් රුපියල් මිලියන 45,067 ට සමාන ජපන් යෙන් මිලියන 31,810 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය යටතේ වූ ක්‍රියාකාරකම් 2018 මැයි 01 දින ආරම්භ කර තිබූ අතර 2023 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 07 වැනි ඡේදයේ විධිවිධානවලට පටහැනිව මුළු වටිනාකම රු. මිලියන 12 ක්වූ පරිගණක තිස් තුනක්, ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ 260ක් සහ වායු සමීකරණ යන්ත්‍ර 08ක් කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ ගිණුම් ගත කර ඇත. | ව්‍යාපෘතියේ ඇති සියලුම වත්කම් සඳහා ඉන්වෙන්ටරි ලේඛනයක් පවත්වා ගෙන යන අතර 2023 වසර අවසානයේදී සියලු වත්කම් ප්‍රාග්ධනීකරණය කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 23(අ) ඡේදයට අනුව, එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ පවත්නා වූ අවසාන අනුපාතය භාවිතා කරමින් විදේශ මුදල් අයිතම පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, අවසාන අනුපාතය සමඟ නොගැලපීම හේතුවෙන් ව්‍යාපෘතියේ වසර අවසාන ණය ශේෂය රුපියල් මිලියන 75.6 කින් අඩු කර දක්වා තිබුණි. | 2023 වසරේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව එය සකස් කරනු ලබයි. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වෙත යොමු කිරීම | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අංක 01/2019 කළමනාකරණ චක්‍රලේඛයේ 9.3 වගන්තිය. | මෙහෙයුම් කමිටු රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක් පැවැත්විය යුතු වුවද, ව්‍යාපෘතිය ආරම්භයේ සිට කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි. | අවශ්‍යතා අනුව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සිදුකරයි. | චක්‍රලේඛ අවශ්‍යතාවය පිළිපැදිය යුතුය. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘති සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විස්තරාත්මක සැලසුම් සහ ලංසු තැබීමේ සහාය සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තුව. | i. මෙම ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම 2017 ජූලි 07 දින අත්සන් කරන ලද අතර ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2018 මැයි 01 වන දින ආරම්භ කළ යුතු වුවත් එය අත්සන් කර තිබුණේ | කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ නිරෝධායනය හේතුවෙන් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය . | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පද්ධතිය විධිමත් කිරීමට කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | 2020 ජූලි මාසයේදිය. | | |
| | | ii. ණය ගිවිසුමට අනුව, 2025 අගෝස්තු මාසයට පෙර අවසන් මුදල් ලබා දීම සිදු කළ යුතුය. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි කාලය වූයේ මාස 32 ක් පමණි. එබැවින් මෙම ව්‍යාපෘතියේ සංරචක සැලසුම් කර ඇති පරිදි නිම කිරීමට ඉහළ අවදානමක් ඇති බව හඳුනාගත හැකිවිය. | ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය හේතුවෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | | iii. මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2020 ජූනි මස ආරම්භ කර 2023 සැප්තැම්බර් මස අවසන් කලයුතු ඉදිකිරීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් පූර්ව ඉදිකිරීම් අදියරේ තිබුණි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | ණය දෙන නියෝජිතායතනයෙන් හෝ විකල්ප මූලාශ්‍රයකින් මුදල් ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජල තුළුමුව පහසුකම සහ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම, - පැකේජය 01 | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම සංරචකයේ නියමිත ඉදිකිරීම් කටයුතු 2020 ජූනි මස ආරම්භ කර 2023 සැප්තැම්බර් මාසයේදී අවසන් කළ යුතු වුවද, එහි ප්‍රගතියක් 2022 දෙසැම්බර් 31 වන විටත් පෙන්නුම් කර නොතිබුණි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් මුදල් ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සම්ප්‍රේෂණ ප්‍රධාන ජාලයන් බෙදාහැරීමේ ජාලයන් සැපයීම සහ ඇතිරීම් - පැකේජය 02 | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම සංරචකයේ ඉදිකිරීම් කටයුතු 2020 ජූනි මස ආරම්භ කර 2023 සැප්තැම්බර් මාසයේදී අවසන් කළ යුතු වුවද, ඉංජිනේරු ඇස්තමේන්තුව අනුමත කිරීමෙන් පසු එහි ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් මුදල් ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | භූගත ජලාශ සහ පොම්පාගාර ඉදිකිරීම - පැකේජය 03 | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම සංරචකයේ ඉදිකිරීම් 2023 සැප්තැම්බර් මස අවසන් කිරීමට නියමිතව තිබුණද, කෙසේ වෙතත් එය 2022 දෙසැම්බර් 31 වන විට පූර්ව ඉදිකිරීම් අදියරේ පැවති අතර, ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කිරීම යටතේ ලංසු ප්‍රමාණ පත්‍රය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කර තිබුණි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් මුදල් ලබාගෙන ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මිල්ලනිය සඳහා ද්විතියික බෙදාහැරීම් ජාලය සැපයීම සහ ඇතිරීම - පැකේජය 04. | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම කොටසේ ඉදිකිරීම් 2023 සැප්තැම්බර් මාසයේදී අවසන් කළ යුතු නමුත්, එය 2022 දෙසැම්බර් 31 වන විට පූර්ව ඉදිකිරීම් අදියරේ පැවතුනි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | බෙදාහැරීමේ ප්‍රධාන ජාලයන්හි සහ ද්විතියික ජාලයන්හි ඉතිරි කොටස සැපයීම සහ ඇතිරීම ඇතුළු දිස්ත්‍රික් මිණුම් කලාප (DMA) උපකරණ සැපයීම සහ සවි කිරිම. - පැකේජය 05 | මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මෙම කොටසේ ඉදිකිරීම් 2023 සැප්තැම්බර් මාසයේදී අවසන් කළ යුතු නමුත්, එය 2022 දෙසැම්බර් 31 වන විටත් පූර්ව ඉදිකිරීම් අදියරේ පැවතුනි. | දැනට, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීම තාවකාලිකව අත්හිටුවා ඇත. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් කොන්දේසි 6.5(ඉ) අනුව ඉන්වොයිසිය ඉදිරිපත් කිරීමෙන් දින 56ක් ඇතුළත ඉන්වොයිසිය සඳහා ගෙවීම සිදු කළ යුතු නමුත් උපදේශන කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද රුපියල් මිලියන 294ක වටිනාකමින් යුත් බිල්පත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණි. එම නිසා එම බිල්පත් දින 102-321 අතර කාලයක් සඳහා හිඟව පැවතුනි. තවද | ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට ණය ලබා දීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත. 2021 නොවැම්බර් බිල්පත සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා | හිඟ බිල්පත් පියවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **විශේෂ කොන්ත්‍රාත් කොන්දේසි 6.6 අනුව එම බිල්පත් සඳහා සියයට එකක ප්‍රමාද ගෙවීම් ගාස්තු ගෙවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.** | **නියෝජිත ආයතනය විසින් අවසන් වරට මුදල් ලබා දීම 2022 පෙබරවාරි මාසයේදී සිදු කරන ලදී. 2021 දෙසැම්බර් සිට, ශේෂ සහතික කරන ලද අතරමැදි ගෙවීම් බිල්පත් සියල්ල තවමත් ඉතිරිව පවතී.** | |

**3.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|
| **2020 දෙසැම්බර් 31 වන දින රුපියල් මිලියන 83.6 ක බලමුලු ගැන්වීමේ අත්තිකාරම් මුදල දේශීය උපදේශක වෙත ගෙවා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මුදලින් රුපියල් මිලියන 50.2 ක හිඟ ශේෂයක් කොන්ත්‍රාත්කරු සතුව ඉතිරිව තිබුණි. එදිනට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු බිල්පත්වල වටිනාකම රු. මිලියන 99 කි. ඉහත අත්තිකාරම් පියවීමට වැඩපිළිවෙලක් නොමැතිව, 2022 දෙසැම්බර් 31 දින සිට කොන්ත්‍රාත්කරු තාවකාලිකව අත්හිටුවීමට ව්‍යාපෘතිය විසින් නිර්දේශ කර තිබුණි.** | **ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් 2022 අප්‍රේල් මාසයේ සිට අරමුදල් බෙදා හැරීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත. හිඟ බිල්පත් ගෙවීමෙන් ඉතිරි අත්තිකාරම් පියවාගැනීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලීම් කර ඇත.** | **අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය.** |